

# 30

# පොදු දේපළ රැක ගනිමු

ශිෂ්‍ය සමිතියේ දී "පොදු දේපළ රැක ගනිමු" යන මැයෙන් අලංකාර කතාවක් පවත්වනු ලැබිණි. අපි ද එයට වරක් සවන් දෙමු.

ගරු ගුරු භවතුණි!, සහෝදර සහෝදරියනි! අද මම ඔබ ඉදිරියේ "පොදු දේපළ රැක ගනිමු" යන මාතෘකාව යටතේ කුඩා කථාවක් පැවැත්වීමට ඉදිරිපත් වෙමි. ජනතාව අතර ආත්මාර්ථකාමී ලක්‍ෂණ වැඩි වෙමින් පවතින මෙම කාල වකවානුව තුළ මෙම මාතෘකාව පිළිබඳ ව කතා කිරීම කාලෝචිත යයි මම අදහස් කරමි.

දයාබර මිත්‍රයිනි! පොදු දේපළ යනු කුමක් ද? තනි පුද්ගලයකු විසින් හෝ කණ්ඩායමක් විසින් හෝ වකුෆ් (පරිත්‍යාග) කරන ලද වස්තුව පමණක් නොව රජය සතු දේපළ ද පොදු දේපළ ලෙස සැලකේ. මේවා තනි පුද්ගලයකුගේ භාවිතය සඳහා පමණක් වෙන් වූ දේ නොවේ. ජනතා සුබ සිද්ධිය පදනම් කර ගනිමින් ඇති කරන ලද ඒවා වේ. පාසල්, මස්ජිද්, රෝහල්, පුස්තකාල, පොදු නාන ළිං, පොදු වැසිකිළි, පොදු ප්‍රවාහන පහසුකම්, මහා මාර්ග, බස් නැවතුම් පොළවල්, මල් වතු, සුසාන භූමි ආදිය පමණක් නොව ස්වාභාවිකව පිහිටා ඇති මුහුදු වෙරළ, වනාන්තර, ගංගා, වැව් ආදී සියල්ල පොදු දේපළවලට අයත් වේ.

මෙම පොදු දේපළ අප පරිහරණය කරන්නේ කෙසේ දැයි මඳක් සිතා බලන්න. අප නිවසේ දී අපට අයත් වස්තුවක් භාවිත කරන විට දක්වන සැලකිල්ල හා ප්‍රවේසම, පොදු දේපළ භාවිතයේ දී ද අපට හැඟෙන්නේ ද? අප නිවසේ ඇති වස්තුවකට හානියක් සිදු වන විට හැඟෙන දුක හා වේදනාව පොදු දේපළට හානි වන විට අපට හැඟෙන්නේ ද? අප නිවසේ ඇති භාණ්ඩ අලංකාරව හා ක්‍රමවත්ව තැබීමේ දී අපට ඇති වන උනන්දුව හා අවශ්‍යතාව, පොදු දේපළ විෂයෙහි ඇති වන්නේ ද? අපි අපේ හෘද සාක්ෂියෙන් විමසා බලමු. ඇත්ත වශයෙන් ම අප පොදු වස්තු විෂයයෙහි ක්‍රියාකරන්නේ නොසැලකිල්ලෙන් හා වගකීමකින් තොරව ය. අපගේ මෙම හැඟීම වෙනස් විය යුතු නොවේ ද?

දයාබර සහෝදරයනි! ඉස්ලාම් යනු ආගමික වත් පිළිවෙත් හා සිරිත් විරිත් පමණක් රකින ආගමක් නොවේ. එය සමස්ත ජීවිතයට ම මාර්ගෝපදේශයක් බව අවබෝධ කර ගමු. මේ අනුව අපගේ ධර්මයෙහි පොදු වස්තූන් රැකීම හා ආරක්ෂා කිරීම සම්බන්ධව බොහෝ අවස්ථාවල අප දැනුම්වත් කර ඇත. ගැත්තකු අල්ලාහ්ට කළ යුතු යුතුකම් සේ ම අන් මිනිසාට කළ යුතු යුතුකම් රාශියක් ද ඇත. සියල්ලන් ම පරිහරණය කරන පොදු දේපළ ප්‍රවේශමෙන් භාවිත කිරීම හා ආරක්ෂා කිරීම ඒ අතරින් ඉතා වැදගත් එකකි. අප එය ප්‍රවේශමින් පරිහරණය කරනවාත් සමගම, අන් අය ද ඒ සඳහා පෙළඹවීම අප සතු වග කීමකි. අල්ලාහ් ඔබ දෙස බලා මෙසේ පවසයි.

**"ඔබ හොඳ දේ කිරීමෙහි දී (අල්ලාහුට) බිය වී එකිනෙකාට පිහිට වනු (5: 2)**

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ පහත ආකාරයට පවසූහ.

" ඔබලා එකිනෙකා වගකිව යුත්තෝ වෙති. ඔබගේ වගකීම පිළිබඳ නිශ්චිත වශයෙන් ම ඔබගෙන් විමසනු ලබන්නේ ය." (මුස්ලිම්)

මේ අනුව අප මෙලොව කුමක් පරිහරණය කරන්නේ ද? ඒ සියල්ල පිළිබඳව පරලොව දී විමසීමට ලක්කරනු ලැබේ. මස්ජිදයේ කෙසේ විනීතව හැසිරුණේ ද? පාසල කෙසේ ආරක්ෂා කර රැක ගන්නේ ද? අප ක්‍රීඩා කරන පිට්ටනිය කෙලෙස තබා ගන්නේ ද? අප යන එන රෝහල් වල කෙලෙස හැසිරෙන්නේ ද? තව ද විවිධ වූ පොදු ස්ථාන සියල්ල ම පරිහරණය කරන්නෙමු ද? ඒ සියල්ල ම අපි කෙලෙස පිළිබඳ ව විමසනු ලබන ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතුයි, යන්න අපට අමතක වූවා ද?

වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා තම මිතුරන් වෙත, "ඔබලා ශාපයට ලක් වූ දෙදෙනාගෙන් මිදී අවධානයෙන් සිටින්න" යයි පැවසුවේ ය. එවිට එම මිතුරෝ, 'අල්ලාහ්ගේ දූතයාණනි! එම දෙදෙනා කවුරුන් ද'යි විමසූහ. එයට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ, 'මිනිසුන් ගමන් කරන මාර්ගයෙහි නැති නම් සෙවණ ලබා දෙන ස්ථානවල මූත්‍ර කරන්නන්" යයි පැවසූහ. (මුස්ලිම්)

පොදු ස්ථාන අපවිත්‍ර කිරීම ශාපයට ලක් වූ කරුණක් ලෙස නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් මෙහි පෙන්නුම් කරන ආකාරය දෙස බලන්න. වර්තමාන ජනයා තම විවේකය ගත කිරීමට යන පොදු ස්ථාන අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් ද, නොමනා හැසිරීමෙන් ද විනාශ කරන අයුරු ඔබ බොහෝ අවස්ථාවල දැක ඇත. මේ සියල්ල ඉස්ලාමීය දෘෂ්ටියෙන් දැඩි ගැරහුමකට ලක් කර ඇත; දැඩි දඬුවමට ද ලක් කර ඇත.

පොදු දේපළවලට හානි කිරීම හා ඒවා සොරකම් කිරීම අතිමහත් පාපයකි. අපෙන් සමහරෙකු අන් අයගේ වස්තුවත්, දේපළත් සොරකම් කිරීම මහා පාපයක් ලෙස සැලකුව ද පොදු වස්තුවක් සොරා ගැනීමක දී එලෙස සිතන්නේ නැත. තනි මිනිසකුගේ හෝ ආයතනයක හෝ, රජයේ හෝ වස්තුවක් තමා සතු කර ගැනීම සොරකමක් බව අප මනාව අවබෝධ කර ගත යුතු ය. සැබැවින් ම පොදු වස්තුවක් පැහැර ගැනීම, විනාශ කිරීම අනෙකුත් සියල්ලට ම වඩා අතිමහත් පාප ක්‍රියාවක් ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ යුද්ධයේ දී පවා පොදු දේපළ විනාශ කිරීම වැළැක්වූහ. එතුමාණෝ "අන්‍ය ආගමික දේවස්ථාන ගොඩනැගිලි හා ගස් විනාශ නොකරන්න" යයි තරයේ අවවාද කර ඇත්තාහ.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගෙන් පුහුණුව ලත් සහාබිවරුන් ද ඔවුන්ගේ පසුගාමීන් ද පොදු ධනය, පොදු දේපළ භාවිතයේ දී පිළිවෙත් සුරැකූයේ කෙසේ ද යන්නට ඔබේ අවධානය යොමු කරන්න.

වරක් කලීෆා අබූ බක්කර් රළියල්ලාහු අන්හු තුමාගේ බිරිඳ සැමද බෙදන ආකාරයට ආහාර බෙදුවා ය. එම ආහාරත් සමඟ පැණි රස ද්‍රව්‍යයක් ද බෙදා තිබුණි. මෙය දුටු අබූබක්ර් රළියල්ලාහු අන්හු තුමා විස්මයට පත් වූයේ ය. "රස කැවිලි සෑදීම සඳහා මුදල් ලැබුණේ කෙසේ ද?" යි ඔහු තම බිරිඳගෙන් විමසුවේ ය. එයට එතුමිය, පවුලේ වියදම සඳහා දෛනිකව භාණ්ඩාගාරයෙන් ලබා දෙන මුදලින් ටික ටික ඉතුරු කර ගනිමින්, මෙය සකස් කළෙමි," යැයි පිළිතුරු දුන්නා ය. එවිට කලබලයට පත් වූ කලීෆා තුමා "කුමක් ද මේ? අපට ලබා දෙන ජනතාවගේ මුදලින් ඉතිරි කර ගෙන සකස් කළ රසකැවිලි ද මේවා? අප තවමත් ධනවතුන් ලෙස ජීවත් වන බවත් මට හැඟෙන්නේ ය. අපට අවශ්‍ය පමණට වඩා රාජ්‍ය මුදල් හිමි වන බවක් මෙයින් පෙන්නුම් කරයි." යයි පවසා වහා ම භාණ්ඩාගාර පාලක වෙතට "තම වැටුප අඩු කරන්න" යැයි දැනුම් දුන්නේ ය.

එලෙස ම වරක් කලීෆා උමර් රළියල්ලාහු අන්හු තුමා අසනීප වී සිටියේ ය. ඔහුට වෙදකම් කිරීම සඳහා මී පැණි අවශ්‍ය විය. බොහෝ ප්‍රදේශවල සොයා බැලුව ද මී පැණි මඳක් හෝ නොලැබිණි. කලීෆා තුමා සලාත් කළ වහා ම තම අවශ්‍යතාව පැවැසුවේ ය. පසුව භාණ්ඩාගාරයෙන් තම අවශ්‍යතාව සඳහා මී පැණි ස්වල්පයක් ලබා ගැනීම සඳහා ජනයාගෙන් අවසර පතා සිටියේ ය. මෙය ඇසූ ජනතාවෝ තිගැස්සුණහ. ඔවුන්ගේ හදවත් උණු විය.

වරක් කලීෆා උමර් බින් අබ්දුල් අසීස් රහ්මතුල්ලාහි අලෛහි තුමා හමුවීමට දුර බැහැර පෙදෙස්වල සිට දූතවරුන් පිරිසක් රාත්‍රි වේලාවේ දී පැමිණියහ. නිඳ ගැනීමට සූදානම් ව සිටි කලීෆා තුමා එසේ පැමිණි දූතවරුන්ට තමන් මුණගැසීම සඳහා අනුමැතිය දුන්හ. එනිසා එම දූතවරු කලීෆා තුමාගේ නිවසට ඇතුළු වූහ. එවිට කලීෆා තුමා ලාම්පුවක් දැල්වූයේ ය. ඊට පසුව පැමිණි දූතවරුන්ගේ ප්‍රදේශය පිළිබඳ ව ද එම ප්‍රදේශයේ ජනයා පිළිබඳව ද සවිස්තරාත්මක ව විමසීම ඇරඹුවේ ය. ඔවුහු තම ජනයාගේ ගැටලු පිළිබඳ ව ද සාකච්ඡා කළහ.

පසුව එම දූතවරු "ඕ අමීරුල් මුඃමිනීන් තුමනි! ඔබ තුමාගේ සැප සනීප කෙසේ ද? ඔබ තුමාගේ පවුලේ තත්ත්වය කෙසේ ද?" යනාදී වශයෙන් විමසීමට පටන් ගත්තෝ ය. එවිට කලීෆා තුමා වහා ම දැල්වෙමින් තිබූ ලාම්පුව නිවා දමා, වෙනත් ලාම්පුවක් දැල්වූයේ ය. එය දුටු ඔවුහු කලීෆා තුමා මෙසේ කිරීමට හේතුව කුමක් දැයි පුදුමයෙන් ඇසූහ. එයට කලීෆා තුමා මම ඔබ සමඟ රටේ ජනතාව සහ පොදු ජනතාව පිළිබඳව කතා කරමින් සිටි විට රටේ පොදු භාණ්ඩාගාරයෙන් ලැබූ ලාම්පුව දල්වා තබුයෙමි. ඔබ මාගේ පවුලේ තත්ත්වය පිළිබඳව විමසූ විට එම ලාම්පුව නිවා දමා මාගේ ලාම්පුව දැල්වූයෙමි, යි කීවේ ය.

දයාබර සහෝදරයිනි, අපට පෙර සිටි අය පොදු දේපළ පරිහරණයේ දී කෙතරම් ප්‍රවේශමෙන් හැසිරුණේ දැයි බලන්න. අපි පොදු දේපළ රැක ගැනීමෙහි ලා දැඩි උනන්දුවක් දැක්විය යුතු තත්ත්වයක සිටින්නෙමු. අන් අය අප අගය කිරීමට ලක් කරන්නේ පොදු ස්ථානවල අප හැසිරෙන ආකාරය ලෙස බැලීමෙන් ය. අප අදහන ආගම අගය කරන්නේ ද එලෙස ම ය. එහි දී අප ආදර්ශවත්ව හැසිරීමට උත්සාහ කළ යුතු ය. පොදු දේපළ රැක ගැනීමේ

හැඟීම අප වෙත නොඑන තෙක් දේශානුරාගය ද අපහට හැඟෙන්නේ නැත. පොදු දේපළ පිළිබඳව අප තුළ විරුද්ධ අදහස් පවතී නම් එය වෙනස් කර ගත යුතු ය. අප නොසැලකිල්ලෙන් මිදී වගකීමෙන් කටයුතු කළ යුතු ය. අපෙන් කෙනෙකු පොදු ස්ථානයක කුණු කසළ දමන විට "මා පමණක් දැමීමෙන් විශාල හානියක් සිදු නොවේ" යයි නොසිතිය යුතු ය. එක් එක් අය මෙලෙස සිතා දහසක් දෙනා කුණු කසළ දැමුවේ නම් සිදු වන්නේ කුමක් ද? මුළු පරිසරය ම දුගඳ වන්නේ නොවේ ද?

එබැවින් මාගේ මිතුරනි, පොදු දේපළ විෂයයෙහි වඩාත් ප්‍රවේශමින් සිටිමු. එය අපගේ පෞද්ගලික දේපළක් සේ රැක ගනිමු. මතු පරම්පරාවට ද පරිහරණය කළ හැකි සේ එය ආරක්ෂාකාරීව රැක ගනිමු. එමගින් අන් අය අතර මුස්ලිම්වරුන් පිළිබඳ යහපත් හැඟීමක් ඇති කරමු.

## අභ්‍යාස

1. පොදු දේපළ යනු කුමක් ද?
2. අප පොදු දේපළ රැක ගත යුත්තේ ඇයි?
3. පොදු දේපළ විනාශ කිරීම නිසා ඇති වන විපාක කවරේ ද?
4. පොදු දේපළ පිළිබඳ ව නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා පැවසූ හදීසයක් ලියන්න.
5. අපගේ මුතුන් මිත්තන් පොදු දේපළ විෂයයෙහි කොතෙක් දුරට පිළිවෙත් සුරකිමින් සිටියේ දැයි නිදසුන් මඟින් ගෙන හැර දක්වන්න.

## ක්‍රියාකාරකම්

" පොදු දේපළ රැක ගනිමු" යනුවෙන් සඳහන් පුවරු සකස් කර පාසලේ විවිධ ස්ථානවල ප්‍රදර්ශනය කර තබන්න.